# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2205/5 - 2020 දෙසැම්බර් මස 08 වැනි අඟහරුවාදා - 2020.12.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු
නගර සභා ආඥාපනතේ 184(1අ) වැනි වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ 184 (1අ) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, වත්තල මාබෝල නගර සභාව හා එහි සභාපති වශයෙන් කටයුතු කිරීමේදී ඉහත කී නගර සභා ආඥාපනතේ 184(1) උප වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදු කර තිබේද යන්න පරීක්ෂා කර මාස 3 ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අංක 2152/14 හා 2019 දෙසැම්බර් මස 03 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පත් කරන ලද විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු චන්ද්‍රදාස නානායක්කාර මැතිතුමාගෙන් සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ සභාවෙහි පරීක්ෂණ කාලය 2021 මාර්තු මස 03 වැනි දින දක්වා දීර්ඝ කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී පීඑච්ඩී
එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝර්ස්
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2020 දෙසැම්බර් මස 03 වැනි දින,
බත්තරමුල්ල, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1A - G 33314 — 25 (2020/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණදෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.